# සිදත් සඟරාවේ දැක්වෙන උබබස්ලකර පිළිබඳ ව විද්වත් මත සමාලෝචනයක්

**හෙ. ව. බිහේෂ් ඉන්දික සම්පත්**

Alankânkara is the fundamental of exquisite poetry. Every so often Sanskrit Alankânkara convention is associated in Sinhala Alankânkara techniques. However "Ubabas lakara" described in "Sidath Sangara" has not been defined by connoisseurs of Sanskrit. According to the author of "Sidath Sangara" the unique property of "Ubabas lakara" is reply & re-replies in dialogue with a special custom at the end. This portrayal has been discussed by veterans in Sinahala literature such as Ratmalane Dharmarama Thero, W. F. Gunewardena, Senerath Paranawithana and others with different interpretations. While assessing & studying all interpretations of veterans, this study is to reveal the true nature of "Ubabas lakara."

**ප්‍රවේශය**

කාව්‍ය ශෝභාව ඇති කරවන ධර්මතා *"අලංකාර"* නම් වේ. (ලක්ෂ්මණදාස, මෛහරචන්ද්‍ර, 1933, පි. 70) සිංහල කාව්‍ය ශාස්ත්‍රයේ විකාසනය කෙරෙහි සංස්කෘත සාහිත්‍යයෙන් ප්‍රබල ආභාසයක් ලැබී ඇතත් සිංහල ඡන්දෝලංකාර ග්‍රන්ථ හා චිරන්තන සිංහල පද්‍ය නිර්මාණ අධ්‍යයනයේ දී පැහැදිලි වනුයේ සිංහලයට ම අනන්‍ය වූ ඡන්දෝලංකාර සම්ප්‍රදායයක් පැවැති බව ය. *සිදත් සඟරාවේ* දැක්වෙන *"උබබස්"* නම් අලංකාරය ද කිසි යම් පමණකට සිංහල අලංකාර සම්ප්‍රදායයේ අනන්‍යතා ලක්ෂණ ප්‍රකට කරන්නක් වශයෙන් සැලකිය

---

© **ආචාර්ය හෙ. ව. බිහේෂ් ඉන්දික සම්පත්**

සංස්. ආචාර්ය පූජ්‍ය මීමුරේ ගුණානන්ද හිමි, මහාචාර්ය ඊශා හේවාබෝවල, මහාචාර්ය සුසන්ත මහලේපත, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රියංකර රත්නායක
මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 19 කලාපය, 2012/13, මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

හැකි වනුයේ සංස්කෘත ආලංකාරිකයන් *"උභය භාෂා"* නම් අලංකාරයක් විග්‍රහ කොට නොමැති බැවිනි. එහෙත් ඒ පිළිබඳ ව සිදත් සඟරාවේ ඉදිරිපත් වනුයේ අපැහැදිලි වූත් මතභේදයට මුල් වන්නා වූත් විග්‍රහයකි.

උබබස් නම් අලංකාරය සදත් සඟරා කරුවාගේ ම හඳුන්වාදීමක් ද? ඉන් පෙර එ වන් අලංකාරයක් සිංහල අලංකාර ශාස්ත්‍රය තුළ නො පැවතිණි ද? උභය භාෂා නම් අලංකාරයක් සංස්කෘත ආලංකාරිකයන්හට විෂයය නො වූයේ ඇයි? මීට සමාන ලක්ෂණ සංස්කෘත කාව්‍ය ශාස්ත්‍රයේ පැවතිණි ද? උබබස් අලංකාරය හුදු උත්තර-ප්‍රත්‍යුත්තර කියා ගැන්මක් පමණක් ද? එය යෙදෙනුයේ කුමන උක්ති ක්‍රමයක් මුල් කොට ගනිමින් ද? ආදි වශයෙන් එ කී අලංකාරය සම්බන්ධයෙන් ගැටලු රාශියක් පැනනගී. ඒවා විසර්ජනය කිරීමට විද්වතුන් ඉදිරිපත් ව තිබේ. එහෙත් එම මතවාද අතුරෙහි ද පරස්පරතාවක් දැක ගත හැකි වේ. ඒ පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක යෙදී උබබස් අලංකාරයේ සත්‍ය ස්වරූපය අනාවරණය කරලීම මෙම ලිපියේ අරමුණ යි.

උභය භාෂා අලංකාරය පිළිබඳ ව ඉදිරිපත් ව ඇති විවිධ අර්ථ නිරූපණ අතුරින් රත්මලානේ ධර්මාරාම හිමි (1902), ඩබ්. ඇෆ්. ගුණවර්ධන (1907), සෙනරත් පරණවිතාන (1956), ගුණදාස අමරසේකර (1996), දර්ශන රත්නායක (2009) යන විචාරකයන්ගේ මත දැක්වීම් විශේෂ වෙයි. එම මතවාදවලට මුල් වූ සිදත් සඟරා විග්‍රහය පළමු කොට විමසා බැලීම වැදගත් ය.

**සිදත් සඟරා විග්‍රහය**

සිදත් සඟරාකරු "ලකර අදියර" (අලංකාරාධිකාරය) යටතේ උබබස් අලංකාරය හඳුන්වා ඇත්තේ,

*"උතුරු පසතුරු දෙන - දෙ දෙනකු වදන් පිරියතැ*
*වැනියටි සිරිත් වෙසෙසක් - පළවතුබබස් නම් වේ."*

(ධර්මාරාම හිමි, රත්මලානේ, 1902, පි. 216)

උත්තර-ප්‍රත්‍යුත්තර කියා ගන්නා වූ දෙ දෙනකුගේ කථාබහ අවසානයේ වර්ණනා කරනු කැමති වූ චාරිත්‍ර විශේෂයක් ප්‍රකාශ වීම

උභය භාෂා අලංකාරයේ ලක්ෂණය බව මින් පැවසේ. සිදත් සඟරා කරුවා උභය භාෂා අලංකාරය සඳහා නිදර්ශන වශයෙන් දක්වා ඇත්තේ පහත පද්‍යය යි.

*"සඳ වන සිඳු කිය කුඹුයොන නම සතරා*
*කි වී සෙවෙත තො ද වැලිනී යළ තො ගොරා*
*අරුණු කිහෙනි වී කෙරළන් ලැබැ හුරිරා*
*පැටිවනෙදෙසැ යුද පතිරජ දිය ඉසුරා"*

(එම, පි. 216)

මෙම සංවාදයේ උත්තර-ප්‍රත්‍යුත්තර කියා ගැන්ම සිදු වනුයේ පහත පරිද්දෙනි,

"සඳ වන සිඳු"
"කිය කුඹුයොන"
"නම සතරා කි වී"
"සෙවෙත තො ද"
"වැලිනී යළ තො ගොරා"
"අරුණු කිහෙනි වී"
"කෙරළන් ලැබැ හුරිරා"
"පැටිවනෙදෙසැ යුද පතිරජ දිය ඉසුරා"

මෙය අගස්ති ඍෂිවරයා හා වාලුකා නදිය අතර සංවාදයක් බැව් රත්මලානේ ධර්මාරාම හිමි පවසන නමුදු (පි. 216), ඩබ්. ඇෆ්. ගුණවර්ධන මෙය විග්‍රහ කරනුයේ සාගරය හා වාලුකා නදිය (මහවැලිය) අතර සංවාදයක් වශයෙනි. (ගුණවර්ධන, ඩබ්. ඇෆ්, 1962, පි. cxxiv)

| | | |
|---|---|---|
| සාගරය | - | භවති සන්ධ්‍යාවර්ණ නදිය, (සඳවණසිඳු) |
| මහවලිය | - | භවත් අගස්තිය කිය, |
| සාගරය | - | කවර හෙයින් (මගේ) සතුරාගේ නමින් (මට) ආමන්ත්‍රණය කළෙහි ද? |
| මහවැලිය | - | තො ද මගේ සැතිරියගේ නමින් මට ආමන්ත්‍රණය කළෙහි ය. |

| | | |
|---|---|---|
| සාගරය | - | (වේවා!) වාලුකා නදිය, තෝ ප්‍රකෘතියෙන් ගෞර ය. කවර හෙයකින් අරුණ වර්ණ වූයෙහි ද? |
| මහවැලිය | - | කේරලයන්ගේ රුධිරය ලැබ ය. |
| සාගරය | - | (සැබව) පතිරජදෙව් තෙමේ ඔය දික්හි යුද ඇරඹවී ද? |

මෙහි පළමු භාෂකයා ධර්මාරාම හිමි පවසන පරිදි අගස්ති ඍෂි නො ව අගස්තිගේ සතුරකු වශයෙන් දැක්වෙන සාගරය යි. අගස්ති සාගරය පානය කළ බැවින් ඔහු සාගරයේ සතුරකු වශයෙන් සාහිත්‍යයේ ප්‍රකට වේ. තව ද සියලු ම ගංගා සාගරය නම් ස්වාමියාගේ වනිතාවන් බව කවිසමයෙහි කියැවෙන බැවින් ගංගා ද සපත්නී රෝෂය කරණ කොට ගනිමින් එකිනෙකට සතුරු වේ. දඹදිව සන්ධ්‍යා වර්ණ වූ දිය ඇති නදියක් ඇති සේ ම මහවැලි ගංතෙර දී කේරල සේනාව සංහාරය කෙරුණු බැවින් ඔවුන්ගේ රුධිරය එක් වීමෙන් මහවැලිය ද සන්ධ්‍යා වර්ණ නදිය වැනි විය. එයින් කැළඹීමට පත් සාගරය සන්ධ්‍යා වර්ණ නදිය යැයි සිතා මහවැලියට අමතයි. මහවැලි තොමෝ සිතන්නී ප්‍රේම ප්‍රමෝදය හේතුවෙන් එ සේ තම සැතිරියකගේ නමින් තමාට අමතන බව යි. නදී තොමෝ ද ඊට පිළිතුරු වශයෙන් සාගරයේ සතුරකු වන අගස්තිගේ නමින් එයට අමතයි. සයුර තම සතුරකුගේ නමින් තමාට ආමන්ත්‍රණය කිරීමට හේතුව විමසන කල්හි, තම සැතිරියගේ නමින් ඇමතූ බැවිනැ'යි නදිය පිළිතුරු දෙයි. එ කරුණෙන් මහවැලිය හඳුනා ගන්නා සයුර "වැලිනී" (මහවැලිය) යැයි යළි ආමන්ත්‍රණය කරයි. ඉහත සංවාදයට මුල් ව ඇත්තේ එ කී අවස්ථාව යි. මෙම අර්ථය ප්‍රකට කරනු සඳහා ඩබ්. ඇෆ්. ගුණවර්ධන මීට මුල් වූ ශ්ලෝකය ද ගෙනහැර දක්වා තිබේ. (එම, පි. cxxiv) ඉහත පද්‍යය අවසානයේ සයුර වාලුකා නදිය හඳුනා ගෙන ඒ අනුව ආමන්ත්‍රණය කිරීම ''*සිරිත් වෙසෙසක්*'' වශයෙන් සැලකිය හැකි ය.

උභය භාෂා අලංකාරය සිදත් සඟරාවේ පළමු වරට විග්‍රහ වී තිබෙනු දක්නා ලැබෙතත් එය සිදත් කතුවරයාගේ ම පෞද්ගලික විග්‍රහයක් වශයෙන් සැලකීමට වඩා ඒ වන විට දේශීය කවීන් අතර සම්භාවිත ව තුබුණු අලංකාර ක්‍රමයක් වශයෙන් සැලකීම සාධාරණ ය. ඇතැම් විට දැනට නෂ්ටප්‍රාය ව ඇති චිරන්තන සිංහල අලංකාර

ග්‍රන්ථවල මෙ බඳු අලංකාරයක් විග්‍රහ වී තිබී ඒ ආශ්‍රයෙන් සිදත් සඟරා කතුවරයා මෙ වන් විග්‍රහයක් කළා වීමට ද පිළිවන. සීගිරි ගී අතුරෙහි ද උභය භාෂා අලංකාරය යෙදී ඇති පද්‍ය දැක ගත හැකි වෙයි.

*"දෙවියෙනි මෙ වැනි එක සුකක් ඇති කරනු*
*දෙ අත් වටැ පළ මය් රූ සුක රුකුරු වනු*
*තොල් (ජැ)හැ (යනු) කොට් මින්දිබිය කුරිර වනු*
*බොටු මල් බලය් සුකනු තය් යහපත් වනු"*

(Paranavitana, S, 1956, p. 196.)

- දෙවියනි, මෙ වැනි තැනැත්තියක සමඟ සැපයක් ඇති කරන්න.
- දෙ අත් වටා පළ වූ මගේ රූපයෙහි ආස්වාදය විඳ ගන්න.
- දෙ තොල් හැර දමා යෑමට (මා පෙළඹූ) අහංකාර ස්ත්‍රිය කුරිරු වන්නී ය.
- ගෙල වටා වූ මල් බලා ආස්වාදයක් ලබා ගන්න. ඔබට යහපතක් වේවා.

මෙහි දී චමත්කාරජනක ලෙසින් ඉදිරිපත් කොට ඇති උත්තර-ප්‍රත්‍යුත්තර කථනය හා ඒ අවසානයේ සිදු වන *'සිරිත් වෙසෙසක්'* වශයෙන් ගත හැකි "යහපත් වනු" යන ප්‍රාර්ථනය සෙයින් මේ කවි අරුත් දැනැවීම් වස් උබබස්ලකර භාවිත කළ අවස්ථාවකි.

සංස්කෘත අලංකාර ශාස්ත්‍රයට අනුව අලංකාර, *අර්ථාලංකාර* හා *ශබ්දාලංකාර* යනුවෙන් ප්‍රධාන වශයෙන් දෙ කොටසකට බෙදා දැක්වීමේ දී *ශ්ලේෂ, වක්‍රෝක්ති* යනාදිය ද ශබ්දාලංකාර ගණයට වැටෙන බැවින් උබබස්ලකර ද ශබ්දාලංකාරයක් වශයෙන් හඳුනා ගැනීම වඩාත් සහේතුක වන බව හැඟේ. මෙය අර්ථයට වඩා නිර්මාණයේ ආකෘතියට බද්ධ වූ ලක්ෂණයක් වන බැවිනි. එහෙත් අර්ථ රසය තීව්‍ර කරවන පරිදි මේ යොදා ගත හැකි බව ඉහත පද්‍යවලින් පැහැදිලි වේ.

**රත්මලානේ ධර්මාරාම හිමියන්ගේ විග්‍රහය**

ධර්මාරාම හිමියන්ගේ සිදත් සඟරා විස්තර සන්නයෙහි උභය භාෂා අලංකාරය පිළිබඳ ව කරන අර්ථ දැක්වීම මෙන් ම යථෝක්ත නිදර්ශන පද්‍යය විග්‍රහ කොට ඇති ආකාරය ද සාවද්‍ය බව පෙනේ.

"අගස්ති ඍෂිහුගේත් වාලුකා නදියගේත් උත්තර-ප්‍රත්‍යුත්තර ව්‍යාජයෙන් ප්‍රතිරාජ දේවයන්ගේ ජයග්‍රහණයක් මෙහි වර්ණනා කරන ලද්දේ ය... අගස්ති තෙමේ ප්‍රසිද්ධි හෙයින් සමුද්‍රයට සතුරු ය. එ හෙයින් සමුද්‍ර පත්නී වූ නදියට ද අගස්ති තෙමේ සතුරු වේ. නදී තොමෝ ද අගස්තිට සැතිරි ය. මුහුදු නමැති සතුරාගේ පත්නී හෙයිනි. සතුරු-සැතිරි ව්‍යවහාරය මෙ කී ලෙසින් කරන ලදී. (ධර්මාරාම හිමි, රත්මලානේ, 1902, පි. 216, 217)

ධර්මාරාම හිමියන්ගේ විග්‍රහයෙහි පවත්නා බරපතල ම දෝෂය වනුයේ සංස්කෘත ආලංකාරිකයන් වක්‍රෝක්ති නාමයෙන් දක්වා ඇත්තේ ද උභය භාෂා අලංකාරය ම බව සඳහන් කොට තිබීම යි. (එම, පි. 217)

පූර්ව අවධියෙහි සංස්කෘත විචාරකයන් වක්‍රෝක්තිය කාව්‍යයේ අර්ථයට සම්බන්ධ ලක්ෂණයක් වශයෙන් සැලකූ නමුදු පශ්චාත් කාලීන ව එම සංකල්පය වෙනස් ව ගිය බව පෙනේ. පශ්චාත් කාලීනයන්ට අනුව වක්‍රෝක්තිය නම් වනුයේ විශේෂාර්ථයක්හි ගැනීමෙන් කුටිලත්වයට පත් උක්තිය යි. මෙය ශබ්දාලංකාර යටතෙහි විග්‍රහ වී තිබේ. සාහිත්‍ය දර්පණය වැනි විචාර ග්‍රන්ථවලට අනුව වක්‍රෝක්තියෙහි අනුප්‍රභේද දෙකකි. "*අන්‍යස්‍යාර්ථකංවාක්‍ය මන්‍යථායෝජයේද්‍යදි - අන්‍යඃ ශ්ලේෂේණ කාක්වාවා සා වක්‍රෝක්තිස්තතෝවිධඃ*" (වසාක, බාබු භුවනචන්ද්‍ර, 1869, පි. 261) යන්නෙන් පැවසෙන පරිදි කාකු වක්‍රෝක්තිය හා ශ්ලේෂ වක්‍රෝක්තිය ලෙස එම භේදද්වය හඳුනා ගත හැකි ය. කිසි යම් යෙදුමක ගැබ් වුණු ශ්ලේෂාර්ථයක් එ නම් එක ම විට විවිධ වූ අර්ථ කිහිපයක් මතු කිරීම මුල් කොට ගෙන වක්‍ර උක්තියක් ගෙන හැර දැක්වීම ශ්ලේෂ වක්‍රෝක්තියේ ලක්ෂණය යි. වචනයෙන් පවසනවාට සපුරා ම විරුද්ධ වූ අර්ථයක් ගෙන දීම හෙවත් වෙනස් වූ නානාර්ථයක් මතු කිරීම කාකු වක්‍රෝක්තියෙහි ස්වභාවය යි. මේ අනුව දෙ බිඩි අරුතක් මුල් කොට ගෙන චමත්කාරයක් දැනවීම වක්‍රෝක්තියෙහි ලක්ෂණය

වශයෙන් හඳුනා ගත හැකි ය. සංවාදාත්මක අවස්ථා රස ගැන්වීම සඳහා මේ යොදා ගැනීමට පිළිවන. කියන්නා එක් අර්ථයක් අදහස් කොට පවසනු ලබන්නක් අසන්නා අන්‍යාර්ථයෙක්හි යොදා ගෙන තම අර්ථයට අනුරූප ලෙසින් පිළිවදන් දීම මෙහි ලක්ෂණය වේ.

ධර්මාරාම හිමි සංස්කෘත ආලංකාරිකයන් උභය භාෂා අලංකාරයට සමාන ව වක්‍රෝක්ති නම් අලංකාරයක් යොදා ගත් බව පැහැදිලි කිරීමට නිදර්ශන කොට ඇති ශ්ලෝක දෙක ම ශ්ලේෂ වක්‍රෝක්තියට අයත් වේ. ඒ අනුව ඒ හිමියන්ගේ විග්‍රහය පිළිගන්නේ නම් උභය භාෂා අලංකාරය ශ්ලේෂ වක්‍රෝක්තියට සමාන වූවක් බැව් පැවසිය හැකි ය. ධර්මාරාම හිමියන්ගේ පළමු නිදර්ශනය මෙ සේ ය,

*"නාථ! මයූරො නෘත්‍යති - තුරගානනවක්‍ෂසඃ කුතො නෘත්‍යම්*
*නනු කථයාමි කලාපින - මිහ සුබලාපී ප්‍රියෙ! කො'ස්ති"*

(ධර්මාරාම හිමි, රත්මලානේ, 1902, පි. 217)

මෙහි *"මයූරෝ"* යන්නෙන් *මොනරා ද කින්නර පුරුෂයන්ගේ හදවත ද අර්ථ ගැන්වේ. "කලාපිනම්"* යන්නෙන් *මොනරා ද, මිහිරි තෙපුල් කියනසුලු වූ යන්න ද අර්ථ ගැන්වේ.* ඒ අනුව එහි ශ්ලේෂ වක්‍රෝක්තිය මෙ ලෙසිනි,

| | | |
|---|---|---|
| ස්ත්‍රිය | - | පින්වත් හිමියනි, *මොනරා* නටයි. |
| පුරුෂයා | - | සොඳුර, *කින්නර පුරුෂයකුගේ* නැටුමක් කොයින් ද? |
| ස්ත්‍රිය | - | එම්බා ස්වාමිය, පිල් කලප් ඇති මොනරකු මම අදහස් කළෙමි. |
| පුරුෂයා | - | සොඳුර, මේ පෙදෙසේ *මිහිරි තෙපුල් පවසනසුලු වූ* කවරෙක් ඇත් ද? |

*වක්‍රෝක්ති* නම් ශබ්දාලංකාරයේ දී බොහෝ විට උබබස්ලකරෙහි මෙන් උත්තර-ප්‍රත්‍යුත්තර කියා ගැන්මක් දක්නට ලැබෙතත් මේ දෙක එක ම මූලයකින් ප්‍රභව කොට ඇත්තේ යැයි පැවසීමට එය සාධකයක් නො වේ. "වැනියටි සිරිත් වෙසෙසක්" යන සිදත් සඟරා විග්‍රහය උබබස්ලකර වක්‍රෝක්තියෙන් වෙනස් බව කියා පායි.

සිදත් සඟරා කතුවරයාගේ අලංකාර විග්‍රහය පිළිබඳ ගැටලු මතු වේ. සංස්කෘත ආලංකාරිකයන් අලංකාර සිය ගණනක් විග්‍රහ කොට තුබුණු අවධියක සිදත්කරු අලංකාර කිහිපයක් පමණක් ඉදිරිපත් කිරීමට හේතුව පැහැදිලි නැත. උබබස්ලකර හැර ඔහු ඉදිරිපත් කරන අනෙකුත් අලංකාර සංස්කෘත අලංකාරවලට නාමික ව හෝ ලක්ෂණ වශයෙන් හෝ සමානතා දක්වයි. එ බැවින් ධර්මාරාම හිමි ද උබබස් අලංකාරය වක්‍රෝක්තියට සමාන වූවක් වශයෙන් අදහස් කරන්නට ඇත. එ සේ නමුදු සිංහල කාව්‍යවල දී විශේෂයෙන් වැදගත් වන අලංකාර කිහිපයක් පමණක් සාකච්ඡා කිරීම සිදත් කතුවරයාගේ අරමුණ වූවා නම් සෙසු අලංකාරවලින් වෙනස් වන නමුදු සිංහල කවිවල සුලබ වශයෙන් යෙදෙන හෝ සිංහල කවීන්ගේ අනන්‍යතාව ප්‍රකට කෙරෙන අලංකාරයක් වශයෙන් සලකා උබබස්ලකර ද ඒ අතරට එක් කළා විය හැකි ය. සිදත් සඟරාකරු විරුදුවාලකර නමින් දක්වන අලංකාරය ද සංස්කෘත විරෝධාලංකාරය නො වන බව පෙනේ. (එම, පි. 213) ඉන් පැහැදිලි වනුයේ සිංහල අලංකාර ක්‍රමය සංස්කෘතයට සපුරා ම සමාන වූවක් නො වන බව යි. උබබස්ලකර ද එ බඳු අලංකාරයක් වීමට පිළිවන.

### ඩබ්. ඇෆ්. ගුණවර්ධනගේ විග්‍රහය

ඩබ්. ඇෆ්. ගුණවර්ධන තම "ගුත්තිල කාව්‍ය වර්ණනා" කෘතියේ අලංකාර දර්ශනයේ උභය භාෂා අලංකාරය පිළිබඳ අදහස් පළ කරමින් ධර්මාරාම හිමියන්ගේ විග්‍රහයෙහි දොස් දක්වා ඇත. (ගුණවර්ධන, ඩබ්. ඇෆ්, 1962, පි. lv, cxxiii, cxxv) එම විග්‍රහයට අනුව උභය භාෂා අලංකාරය, වක්‍රෝක්තිය වශයෙන් හැඳින්වීමේ සාවද්‍යතාව ප්‍රකට වේ. එහෙත් එය අප්‍රස්තුත ප්‍රශංසාලංකාරයේ භේදයක් වශයෙන් එහි දක්වා තිබීම පැහැදිලි නැත.

"මෙ සේ බලන කල යථෝක්ත පඬිවරයාණන් විසින් උභය භාෂාවට වක්‍රෝක්ති යැයි කියන ලද්දේ, ශබ්දාලංකාර විශේෂයක් වූ වක්‍රෝක්තිය දෙ දෙනකුන් අතරේ කෙරෙන්නා වූ සම්භාෂණයක් හෙයින් ඒ ප්‍රමාණ කොට ගෙන යැයි හැඟේ. දැන් ඉතින් "සඳවනසිඳු" යනාදි නිදසුනෙන් ලක්ෂිත වූ උභය භාෂායෙන් කියවෙන්නේ කුමන අලංකාරයක් ද යන ප්‍රශ්නය මෙහි උපදී. ඊට උත්තරය නම් ඒ අප්‍රස්තුත ප්‍රශංසාලංකාරය වේ' යනු යි. සිදත් නිදසුනෙහි වනාහි

ප්‍රාස්තවික වස්තුව නම් ප්‍රතිරාජ දේවයන්ගේ කේරල සංහාරය යි. නදිය අරුණ වර්ණ වූයේ මේ සංහාරයෙන් හෙයින් මේ වනාහි කාර්යයෙන් නිමිත්ත ආක්ෂිප්ත කළ තැනි. (එම, පි. lviii)

මෙම විග්‍රහයෙන් අනතුරු ව "කාව්‍ය ප්‍රකාශය" ආශ්‍රයෙන් අප්‍රස්තුත ප්‍රශංසාලංකාරය පැහැදිලි කරන ලේඛකයා මෙ වැනි නිගමනයකට එළඹෙයි.

"මේ ලක්ෂණය වනාහි අප්‍රස්තුත ප්‍රශංසායෙහි එක් භේදයක්හුගේ ලක්ෂ්‍යය වෙයි. එ හෙයින් සිදතෙහි ලක්ෂිත වූ මේ උභය භාෂාලංකාරය ද මීට සමාන හෙයින් හෙ ද අප්‍රස්තුත ප්‍රශංසා භේදයකි. (එම, පි. lix)

සිදත් සඟරාවේ දැක්වෙන *"වැනියටි සිරිත් වෙසෙසක්"* යන්නෙන් උභය භාෂා අලංකාරයේ ලක්ෂණය උත්තර-ප්‍රත්‍යුත්තර කියා ගැන්ම පමණක් නො වන බවත් ඒ අවසානයේ චාරිත්‍ර විශේෂයක් ප්‍රකට වීම ද එහි වැදගත් ලක්ෂණයක් වන බවත් පැහැදිලි වේ. එහෙත් "වැනියටි සිරිත් වෙසෙසක්" යන්න අප්‍රස්තුත ප්‍රශංසාවට සමාන ලක්ෂණයක් හැඟවීම උදෙසා යෙදුණේ යැයි සිතීමට නුපුළුවන. සිදත් සඟරාකරුවා උබබස්ලකරට ඉදිරිපත් කරන නිදර්ශන පද්‍යයේ වක්‍රෝක්ති ලක්ෂණය මෙන් ම අප්‍රස්තුත ප්‍රශංසා ලක්ෂණය ද පවතින බව අවබෝධ කොට ගත හැකි ය. එහෙත් මෙම විද්වතුන් දෙ දෙනා ම දක්වන ආකාරයට එම ලක්ෂණ උභය භාෂා අලංකාරයේ මුඛ්‍ය ලක්ෂණ නො වන බව සිදත් කතුවරයාගේ විග්‍රහය මනා ව විශ්ලේෂණය කර බැලීමෙන් පැහැදිලි වේ.

**සෙනරත් පරණවිතානගේ විග්‍රහය**

සිදත් සඟරාවේ දැක්වෙන උබබස්ලකර මූලික වශයෙන් සංවාදාත්මක භාෂා ව්‍යවහාරයක් බවත් එය සංස්කෘත කාව්‍යාලංකාර අතර දක්නට නො ලැබෙන අලංකාරයක් බවත් සෙනරත් පරණවිතාන තම "සීගිරි ග්‍රැෆිටි" කෘතියෙහි සඳහන් කොට තිබේ. (Paranavitana, S, 1956, p. cxc) උබබස්ලකර සංස්කෘත අලංකාර ශාස්ත්‍රයෙහි නො දැක්වෙන්නකැයි පරණවිතාන පවසන අදහස සපුරා පිළිගත හැකි වුවත් ඊට සමාන ලක්ෂණ සංස්කෘත පද්‍ය

අතුරෙහි බෙහෙවින් දක්නට ලැබෙන බැව් නො කිව මනා ය. එ සේ තිබිය දීත් සංස්කෘත ආලංකාරිකයන් මෙය අලංකාරයක් වශයෙන් නො දැක්වීමට හේතුව පැහැදිලි නැත. ඇතැම් විට සංස්කෘත නාට්‍යාදියේ ද මේ වඩාත් උත්කර්ෂවත් අන්දමින් හා සුලබ ලෙසින් යෙදුණු සෙයින් පද්‍යාදි ලිඛිත සාහිත්‍යයට විශේෂ කොට දැක්විය යුතු නැතැයි සිතූ සෙයින් විය හැකි ය. එහෙත් සංස්කෘත සාහිත්‍යයෙහි ලා වීරකාව්‍ය යුගයටත් පූර්වයේ පටන් ලියැවුණු සංවාදාත්මක පද්‍ය හමු වේ. ඍග්වේද ආඛ්‍යානයක දක්නට ලැබෙන මනුෂ්‍ය සංහතියේ ආරම්භය පැවසෙන යම හා යමී අතර සංවාදයත් (තිලකසිරි, ජයදේව, 1988, පි. 21) මහාභාරතයේ එන සයුර හා නදිය අතර සංවාදයත් (තිලකසිරි, ජයදේව, 1961, පි. 21) එ බඳු අවස්ථා ය. උබබස්ලකර සඳහා සිදත් සඟරා කතුවරයා ඉදිරිපත් කොට ඇති නිදර්ශන පද්‍යය ද ඔහුගේ රචනයක් හෝ සිංහල ලේඛකයකුගේ ස්වාධීන නිර්මාණයක් හෝ නො වන බවත් සංස්කෘත පද්‍යයක ඡායානුවාදයක් වශයෙන් සැලකිය හැකි බවත් ඩබ්. ඇෆ්. ගුණවර්ධනගේ විග්‍රහයෙන් තව දුරටත් පැහැදිලි වේ. පහතින් දැක්වෙන එ කී සංස්කෘත පද්‍යයට අනුව සිදත් සඟරා නිදර්ශනයේ උබබස්ලකර යෙදී ඇත් නම් ඊට මුල් වූ එම සංස්කෘත පද්‍යයේ ද එ ලෙසින් ම එම අලංකාරය පවත්නා බව පසක් කොට ගත හැකි ය.

*"කාලින්දි බ්‍රෑහි කුම්භෝද්භව ජලධිරහං නාම ගෘහ්ණාසි කස්මා*
*ච්ඡත්‍රෝර්මේ නර්මදාහං ත්වමපි වදසි මෙ නාම කස්මාත් සපත්න්‍යාඃ*
*මාලින්‍යං තර්හි කස්මාදනුභවසි මිලත් කජ්ජලෛර්මාලවීනාං*
*නේත්‍රාම්භොභිඃ කිමාසාං සමජනි කුපිතඃ කුන්තලක්ෂෝණිපාලඃ"*

| | | |
|---|---|---|
| සාගරය | - | කාලින්ද නදිය! |
| නර්මදා නදිය | - | කුම්භයෝනිය! කිය. |
| සාගරය | - | මම සමුද්‍රයෙමි. මාගේ සතුරාගේ නම කවර හෙයින් ගනිහි ද? |
| නර්මදා නදිය | - | මම නර්මදායෙමි. තො ද මාගේ සැතිරියගේ නම කවර හෙයින් කීයෙහි ද? |
| සාගරය | - | එ සේ නම් කවර හෙයකින් මලින භාවයක් භජනය කෙරෙහි ද? |
| නර්මදා නදිය | - | මාලව වනිතාවන්ගේ නේත්‍රජලයන් හා මිශ්‍ර වූ අඳුන් කරණ කොට ගෙන ය. |

සාගරය - ඔවුන්ට කුමක් වී ද?
නර්මදා නදිය - කුන්තල ධරණීපාල තෙමේ කම්පා විය. (මාලව පුරුෂයන් සිඳින ලද බව මෙහි අදහස යි.)

(ගුණවර්ධන, ඩබ්. ඈෆ්, 1962, පි. CXXV)

**ගුණදාස අමරසේකරගේ විග්‍රහය**

ගුණදාස අමරසේකරගේ "සිංහල කාව්‍ය සම්ප්‍රදායයෙහි" උභය භාෂා අලංකාරය පිළිබඳ ව නව්‍ය අදහසක් ඉදිරිපත් කොට තිබේ. එහෙත් එය කෙ තරම් දුරට අර්ථාන්විත වන්නේ දැයි විමසා බැලීම වැදගත් ය.

ගුණදාස අමරසේකරගේ විග්‍රහයට අනුව අසක්දා කව වැනි දැනට නෂ්ටප්‍රාය ඉපැරණි සිංහල ග්‍රන්ථ සංස්කෘත ආභාසයට ලක් නො වුණු, දේශීය කාව්‍ය මාර්ගයක් අනුව රචනා වූ ස්වතන්ත්‍ර නිර්මාණ ය.

> "...අලංකාරවාදීන් විසින් උසස් කොට සලකන ලද උපමා, රූපක ගහණ වක්‍රෝක්ති මඟ අසක්දා කවෙන් ගත් ගීයෙහි දක්නට නො ලැබේ. එහි ඇත්තේ අලංකාරවාදීන් *"ගම්වැසි වදනක්"* ලෙස සලකන ලද ස්වභාවෝක්ති මඟ යි..... අපට හැඟී යන්නේ අසක්දා කව *ස්වභාවෝක්තිය* ගුරු කොට ලියන ලද කාවයයක් වන්නට ඇති බව යි....... අසක්දා කවෙහි කවි සිරුර අනුකාරක අලංකාර බරු එල්ලනු සඳහා සුදුසු කව් සිරුරක් නො වන නමුදු එය අපගේ කාව්‍ය වංශය සතු, අපට ම ආවේණික ශ්‍රේෂ්ඨ කාව්‍යාලංකාරයක් වන උබබස්ලකර සඳහා ම ඇරුණු කවි සිරුරක් බව සහෘදයාට පෙනී යා යුතු යි..." (අමරසේකර, ගුණදාස, 1998, පි. 31)

> "... උබබස්ලකර යනු අරුත් රස ජනනය ප්‍රධාන කොට ගත් දෙ බස් මඟ යි. ඒ දෙ බස් මඟ විවිධ ස්වරූපවලින් යුක්ත විය හැක. ගුත්තිලයෙහි ඇති 'නො මිහිරි ද මේ වෙණ' වැනි දෙ පිරිසක් අතර දෙ බසක් විය හැක. නැත්නම් 'මට මහලු වයසේ බැරිය වෙණ ගායනා පෙර සේ' වැනි ස්වයං කථනයක් විය හැක. 'සැලමුතු නුගිනුරා රස විඳුන පින් නැතියෙම්' වැනි ආත්ම භාෂණයක් විය හැක. 'මම ය මාතලි රියදුරා

> නම්' වැනි උදාන පාඨයක් විය හැක. මේ සියලු ස්වරූපය දෙ බස් මඟට අයත් වේ. උබබස් අලංකාරයෙන් සජ්ජිත වේ..." (එම, පි. 19)

මෙම සියලු විග්‍රහ අතුරින් අගය කළ හැකි ප්‍රකාශය වනුයේ "උබබස් ලකර යනු අරුත් රස ජනනය ප්‍රධාන කොට ගත් දෙ බස් මඟ යි" යන්න පමණි. ඒ හැරුණු කල දෙ වන උද්ධෘතයෙන් පැවසෙන සෙසු සියලු කරුණු හුදු හිතළුවක් හැටියට බැහැර කළ යුතු වේ. එහි සඳහන් සියලු භේද උභයභාෂා අලංකාරයට අයත් යැයි කිවැ හැකි නො වේ. යථෝක්ත සිදත් සඟරා පාඨයෙන් උත්තර ප්‍රත්‍යුත්තර දීමෙහි ලා යෙදෙන සංවාදාත්මක භාෂාව පිළිබඳ ව විනා ආත්මගත භාෂණ, ඒකල භාෂණ, උදානපාඨ ආදිය පිළිබඳ නිරවුල් අදහසක් නො කියැ වේ. එසේ ම එක් පාර්ශ්වයක් පමණක් නියෝජනය කැරෙන භාෂණයක් උබබස් නම් වනුයේ කෙ සේ ද? 'උභය' නම් වීමට එක ම පුද්ගලයකුගේ සිතුවිලි සමුදායයක් වුව සංවාදයට අනුරූප ව ඉදිරිපත් විය යුතු නො වේ ද? අමරසේකරගේ විග්‍රහය උබබස්ලකර ගැඹුරින් අධ්‍යයනය කොට ඉදිරිපත් කරන ලද්දකටත් වඩා සංස්කෘත නාට්‍යයේ විවිධ කථනෝපක්‍රම උබබස්ලකරට ඈඳා ගන්නා ලදු ව චිරන්තන සාහිත්‍යානුසාරයෙන් සනාථ කිරීමට ප්‍රයත්න කිරීමක් වැන්න. මෙ ලෙසට ම මහගම සේකර ද උත්තර, ප්‍රත්‍යුත්තර කියා ගන්නා ලෙසින් ඉදිරිපත් කෙරෙන කථා ප්‍රවෘත්ති සියල්ල උබබස්ලකරට ඇතුළු කර ඇත. (සේකර, මහගම, 2001, පි. 153)

උභය භාෂා අලංකාරය යනු වක්‍රෝක්තියට පර්යාය වූ අලංකාරයක් නො වන නමුදු සිදත් සඟරාකරු ඊට නිදර්ශන වශයෙන් දක්වා ඇති පද්‍යය *ශ්ලේෂ වක්‍රෝක්තියෙන්* යුක්ත වන්නක් බැව් යට දැක්වීමු. එ හෙයින් "එ කී නිදසුනෙන් උපලක්ෂිත වූ උභය භාෂා අලංකාරය වක්‍රෝක්ති ලක්ෂණයෙන් විරහිත බව කිය යුතු වේ" යැයි ඩබ්. ඇෆ්. ගුණවර්ධන සඳහන් කිරීම (ගුණවර්ධන, ඩබ්. ඇෆ්, 1962, පි. lvii) මෙන් ම ගුණදාස අමරසේකර "ගුණවර්ධන මුදලිඳු විසින් ගුත්තිල කාව්‍ය වර්ණනාවේ දක්වා ඇති පරිදි එය වක්‍රෝක්තිය පිටු දකින්නකි. ස්වභාවෝක්තිය ම පදනම් කර ගත්තකි." (අමරසේකර, ගුණදාස, 1998, පි. 32) යනුවෙන් පැවසීම ද සාවද්‍ය වේ. ඩබ්. ඇෆ්. ගුණවර්ධන දක්වන පරිදි එ කී පද්‍යයේ හෝ උභය

භාෂා අලංකාරය යෙදෙන සියලු ම පද්‍යයන්හි අප්‍රස්තුත ප්‍රශංසා අලංකාරය පවත්නේ යැයි පිළිගැනෙන්නේ නම් අමරසේකරගේ විග්‍රහය නිශේධනය වෙයි.

**හර්සන් ඩයස්ගේ විග්‍රහය**

හර්සන් ඩයස් විසින් තම "ජන කාව්‍ය සම්ප්‍රදාය" කෘතියේ උබබස්ලකර පිළිබඳ ව දක්වා ඇති අදහස් ඒ පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයකින් ඉදිරිපත් කොට ඇති ප්‍රකාශන නො වන බවත් ගුණදාස අමරසේකරගේ අදහස ම තව දුරටත් වර්ධනය කිරීමක් පමණක් බවත් පැහැදිලි වේ. දර්ශන රත්නායක ද එම කරුණ පෙන්වා දී තිබේ. (රත්නායක, දර්ශන, 2009, පි. 53)

> "සසදාවත, මුවදෙව්දාවත හා කව්සිළුමිණ යන ගී කාව්‍යත්‍රයේ පැණෙන විශේෂ ලක්ෂණය වූ උපමා, රූපකවලින් ගහණ වූ වක්‍රෝක්ති මඟ අසක්දා කවෙන් ගත් ගී පාඨවල දක්නට නොමැත. එහි ඇත්තේ අලංකාරවාදීන් විසින් '*ගම් වැසි වදනක්*' ලෙස සලකන ලද ස්වභාවෝක්ති මඟ යි. ස්වභාවෝක්තිය ගුරු කොට ගත් මේ කවි මඟ ජනකවි රීතිය විසින් අනුගත කවි මඟ ම වන්නේ ය....... මේ ගී පාඨ විමසන කල්හි පෙනී යන විශේෂ කාරණයක් වන්නේ ඒවා දෙ බසක් හෝ ආත්ම කථනයක් මුල් කොට ගත් උබබස්ලකරෙන් ඔප් නැගුණු ස්වභාවෝක්තිය පදනම් කොට ගත් කාව්‍යෝක්තීන් වන බව ය....." (ඩයස්, හර්සන්, 2003, පි. 54)

මෙහි එන 'දෙ බසක් හෝ ආත්ම කථනයක් මුල් කොට ගත්' යන්න අමරසේකර අනුව යමින් ම පවසන ලද්දකි. තව ද 'ස්වභාවෝක්තිය පදනම් කොට ගත්' යන විශේෂණය ද උබබස්ලකරට සාධාරණ නො වන බව පෙනේ. එ සේ ම ඔහු උබබස්ලකර ගී කාව්‍ය සතු ප්‍රධාන අලංකාරය වශයෙන් හඳුන්වා තිබීම ද පැහැදිලි නැත. 'අරුත් රස ජනනය ම ප්‍රධාන කොට ගත් දෙ බස් මඟ ඉන් අපේක්ෂිත ය.' යන්න ඩයස්, අමරසේකර අනුව යමින් ම පවසන ලද අදහසක් බව පැහැදිලි ය. එහෙත් 'සංස්කෘත කාව්‍යාලංකාර අතර මේ අලංකාරය නොමැති වීම ගීයේ දේශීය අනන්‍යතාව පළ කරන ප්‍රබල සාධකයකැ'යි පැවසීම ද (එම, පි. 85, 86) සාධාරණ නො වන්නේ, ලක්ෂ්‍ය-ලක්ෂණ වශයෙන් දක්වා නැතත්

මෙය සංස්කෘත කාව්‍යයේ නොවැදගත් වූ ද, සුලබ වූ ද ලක්ෂණයක් වන බැවිනි.

**දර්ශන රත්නායකගේ විග්‍රහය**

දර්ශන රත්නායක 'කල්පලතා' කෘතියේ 'සංවාද ලතා' යටතේ ද උබබස්ලකර පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් ඉදිරිපත් කොට තිබේ. (රත්නායක, දර්ශන, 2009, පි. 46-64) එහි දී ධර්මාරාම හිමියන්ගේ විග්‍රහය ඩබ්. ඇෆ්. ගුණවර්ධනගේ ප්‍රකාශ උද්ධෘත කිරීම මඟින් ම ප්‍රතික්ෂේප කරන ලේඛකයා ගුණදාස අමරසේකර හා හර්සන් ඩයස් යන විචාරකයන්ගේ මතවාද ද විවේචනය කොට දක්වයි. ඔවුන් දෙදෙනාගේ අදහස් සම්බන්ධයෙන් දර්ශන රත්නායක මතු කරන ඇතැම් කරුණු සහේතුක ය.

- අලංකාරවාදීන් විසින් උසස් කොට සලකනු ලැබුවේ වක්‍රෝක්ති මඟ පමණක් ද?
- ස්වභාවෝක්ති මඟ අලංකාරවාදීන් විසින් 'ගම්වැසි වදනක්' ලෙස සලකනු ලැබුවේ ද?
- උබබස්ලකර අපට ම ආවේණික වූ ශ්‍රේෂ්ඨ කාව්‍යාලංකාරයක් ද?
- උබබස්ලකරේ පදනම වනුයේ ස්වභාවෝක්තිය ම ද? (එම, 54)

උභය භාෂා ලක්ෂණය වක්‍රෝක්ති ලක්ෂණයෙන් විරහිත බව ගුණවර්ධන වාසල මුදලි සඳහන් කර ඇතැයි අමරසේකර පවසන්නේ එම විග්‍රහය සාවද්‍ය ලෙස වටහා ගැනීමෙන් යැයි පවසන දර්ශන රත්නායක, ගුණවර්ධන පවසා ඇත්තේ සිදත් සඟරාවේ දැක්වෙන නිදර්ශන පද්‍යය වක්‍රෝක්තියෙන් තොර බව විනා උබබස්ලකර වක්‍රෝක්තියෙන් තොර බව නො වේ යැයි දක්වයි. (එම, 58) එහෙත් සිදත් සඟරා නිදර්ශනයේ වක්‍රෝක්ති ලක්ෂණය පවත්නා බැවින් දර්ශන රත්නායක, ගුණවර්ධනගේ විග්‍රහය පිළිගන්නේ නම් ඔහුගේ මතවාදය ද බැහැර කළ යුතු වෙයි. එ නමුදු සිදත් සඟරා නිදර්ශන පද්‍යයේ අප්‍රස්තුත ප්‍රශංසා අලංකාරය යෙදී ඇති බවට ගුණවර්ධන දක්වා ඇති විග්‍රහය පිළිගැනීම මෙන් ම ඒ ඔස්සේ උබබස්ලකරේ පදනම ස්වභාවෝක්තිය යැයි අමරසේකර දක්වා ඇති මතය නිශේධනය කිරීම ද සාධාරණීකරණය කළ හැකි ය. (එම, 59)

**සමාලෝචනය**

සිදත් සඟරාවේ 'උබබස්' නමින් දක්වා ඇති අලංකාරය හා නිදර්ශන පද්‍යය පිළිබඳ නිශ්චිත අදහසක් පළ කිරීම දුෂ්කර ය. ඒවායේ අර්ථ සපුරා ම ප්‍රකට නො වන බැවිනි. එහෙත් උබබස්ලකර සිංහල කාව්‍යයන්හි දී විශේෂ වැදගත්කමක් හිමි කර ගැනුණු අලංකාරයක් බවත්, එය වක්‍රෝක්ති, අප්‍රස්තුත ප්‍රශංසා ආදියට සමානතා දක්වන නමුදු ඒවායෙන් වෙනස් වන අලංකාරයක් බවත් පැහැදිලි වේ. සිදත් සඟරා කතුවරයා දක්වා ඇති නිදර්ශන පද්‍යයේ ධර්මාරාම හිමි පෙන්වා දෙන පරිදි වක්‍රෝක්තිය ද, ගුණවර්ධන පෙන්වා දෙන පරිදි අප්‍රස්තුත ප්‍රශංසා ලක්ෂණය ද පවත්නා නමුදු උබබස්ලකරෙහි මුඛ්‍ය ලක්ෂණය එය නො වන බව පෙනේ. සිදත් සඟරා විග්‍රහයට අනුව මූලික වශයෙන් උබබස්ලකරෙහි ලක්ෂණ කිහිපයකි,

1. උත්තර-ප්‍රත්‍යුත්තර කථනය
2. දෙ දෙනකු (හෝ දෙ පාර්ශ්වයක්) සම්බන්ධ වීම
3. කථාබහ අවසානයේ චාරිත්‍ර විශේෂයක් වර්ණනා වීම

උබබස්ලකරට සමාන ලක්ෂණ සංස්කෘත කවීන් විසින් උපයුක්ත කොට ගෙන ඇතත් සංස්කෘත ආලංකාරිකයන් එය අලංකාරයක් වශයෙන් හඳුන්වා නො තිබීම මෙ රට විචාරකයන් ඊට අනවශ්‍ය වටිනාකමක් ලබා දීමට හේතු වී තිබේ. උබබස්ලකර ස්වභාවෝක්තිය පදනම් කොට ගත්තක් බව ඩයස්, අමරසේකර වැනි විචාරකයන් පවසන නමුදු යට දැක්වූ කරුණු කාරණා සපුරා ඇත්නම් උබබස්ලකර ස්වභාවෝක්ති, අතිශයෝක්ති, වක්‍රෝක්ති, අප්‍රස්තුත ප්‍රශංසා වැනි ඕනෑම උක්ති මාර්ගයක් හෝ අලංකාරයක් ආශ්‍රය කොට ගනිමින් වුව ද යෙදිය හැක්කක් බැව් අවසන් වශයෙන් නිගමනය කරනු හැකි වෙයි. උබබස්ලකරට සමාන ලක්ෂණ සීගිරි ගීවල පටන් අද්‍යතන කාව්‍ය හා ගේය කාව්‍ය නිර්මාණවලින් පවා දක්නට ලැබේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**
**ප්‍රාථමික මූලාශ්‍රය**
ගුණවර්ධන, ඩබ්. ඇෆ් (සංස්.), **ගුත්තිල කාව්‍ය වර්ණනා**, කොළඹ, 1962.
ධර්මාරාම හිමි, රත්මලානේ (සංස්.), **සිදත් සඟරාව**, පෑලියගොඩ, 1902.
ලක්ෂ්මණදාස, මේහරචන්ද්‍ර (සංස්.), **කාව්‍යාදර්ශය**, ලාහෞර, 1933
වසාක, බාබු භුවනචන්ද්‍ර (සංස්.), **සාහිත්‍ය දර්පණය**, කල්කතා, 1869.
Paranavitana, S. (ed), Sigiri Graffiti, London, 1956.

**ද්වෛතීයික මූලාශ්‍රය**
අමරසේකර, ගුණදාස, **සිංහල කාව්‍ය සම්ප්‍රදායය**, බොරලැස්ගමුව, 1998.
ඩයස්, හර්සත්, **ජන සාහිත්‍ය සම්ප්‍රදාය**, කොළඹ, 2003.
තිලකසිරි, ජයදේව, **වෛදික සාහිත්‍යය**, කොළඹ, 1988.
තිලකසිරි, ජයදේව, **සංස්කෘත කාව්‍ය සාහිත්‍යය**, කොළඹ, 1961.
රත්නායක, දර්ශන, **කල්පලතා**, එල්ලක්කල, 2009.
සේකර, මහගම, **සිංහල ගද්‍ය පද්‍ය නිර්මාණයන්හි රිද්ම ලක්ෂණ**, කොළඹ, 2001.